*සැ. යු.*- 2013.02.08 දින පළ වූ අංක 1,797 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,798 - 2013 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2013.02.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 442 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 444 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මාර්තු මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 පෙබරවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## බස්නාහිර පළාත් සභාව

### 1946 අංක 37 දරන විනෝද බදු ආඥා පනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 12 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අයකිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොළඹ මහා නගර සභාව විසින් 2012.10.25 දින සම්මත කර ඇති යෝජනාව, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 2(2) වගන්තියේ විධි විධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය,<br>
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,<br>
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති,<br>
මිනිස්බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2013 ජනවාරි මස 28 වැනි දින,<br>
කොළඹ 07,<br>
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,<br>
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

02-482

---

### රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම නිවාස සඳහා බෙදාදීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබාදීමට ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන්ට ගල්ගමුව, ගිරිබාව, අඹන්පොල, ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනය

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013 මැයි මස 01, 02, 03 යන දිනයන්හි පෙ.ව. 9.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* ඉඩමේ නම : අනුක්කන්වල යාය,

*(ආ)* ඉඩමේ මැනුම් විස්තර : රජයේ මිනින්දෝරු අයි. ජේ. ගුණවර්ධන මහතා විසින් අඳින ලද කුරුණෑගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් අනුමත කරන ලද 2008.09.08 දිනැති අංක KU/GLG/2008/008 දරන කට්ටි කැබීමේ සැලැස්ම අනුරේඛනයේ සඳහන් කැබලි (මාර්ග හා පොදු කටයුතු සඳහා වෙන් කළ ඉඩම් හැර),

*(ඇ)* ඉඩම පිහිටි ගම : ගොජරාගම සහ කංකානිගම,

*(ඈ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය හෝ කොට්ඨාස : අංක 60 මහගල්ගමුව,

*(ඉ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : ගල්ගමුව,

*(ඊ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල,

*(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : ගොඩ ඉඩම,

*(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය : රජයේ මිනින්දෝරු අයි. ජේ. ගුණවර්ධන මහතා විසින් අඳින ලද අංක KU/GLG/2008/008 දරන කට්ටි කැඩීමේ සැලැස්ම අනුරේඛනයේ සඳහන් ප්‍රමාණය.

2. ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචි පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

(1) ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවකයින්,
(2) ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ යෙදී සිට ක්‍රියාන්විත රාජකාරියේ දී ආබාධිත වූවන්,
(3) ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ සිට ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් වූවන්ගේ,

*(අ)* විවාහක නම් කලත්‍රයා හෝ අවිවාහක දරුවන්,<br>
*(ආ)* අවිවාහක නම් මව හෝ පියා.

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

3. සියළුම ඉල්ලුම්පත්‍ර 2013.03.10 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව" වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2013 මැයි මස 01, 02, 03 යන දිනයන්හි පෙ.ව. 9.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරනු තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. තෝරා ගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසි වලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද ඒ ඉඩම වෙනුවෙන් අක්කරයකට රුපියල් 40,000 බැගින් ගණන් බලනු ලබන මුදලක් තැන්පත් කළ යුතුවේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මුදලට එය හිලව් කරනු ලැබේ.

8. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබාගත හැක.

1. පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල.

2. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව.

ඉඩම් කොමසාරිස් (වයඹ),

2013 ජනවාරි මස 23 වැනි දින.

ඉල්ලුම්පත්‍රයේ හා දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම නිවාස සඳහා බෙදාදීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබාදීමට ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් ගල්ගමුව, ගිරිබාව, අඹන්පොල, ඇහැටුවැව යන ප්‍රාදේශීය ලේකම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරා ගනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. (i) ලිපිනය :————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————.

   *(අ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
   *(ආ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

4. ගෘහමූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහකද යන වග :————.
9. රැකියාව :————.
10. රැකියාව කරන ස්ථානයේ ලිපිනය :————.

11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හා භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :————.

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

12. ඉල්ලුම්කරු හා යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර ඃ

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |

(නිවාස හා දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය)

කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය සඳහන් කරන්න :————.

14. දැනට තමා පදිංචි නිවයේ තත්ත්වය ඃ තමාගේ ද? බද්දට ද? කුලියට ද? අනවසරයෙන් යන වග :————.

15. නිවස පිහිටි ස්ථානය :————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.
17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :————.

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/ විදුහලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත්ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න.

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේද ? තිබේනම් පහත විස්තර සපයන්න :————.

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර බදු ගැනීමෙන් අනතුරුව මාස 06ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙලිවුවහොත් මගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.
ලිපිනය :————.

**දිවුරුම් ප්‍රකාශය**

................................ දිස්ත්‍රික්කයේ.................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ........................................ ග්‍රාම නිලධාරි වසමේ.......................... පදිංචි ................................. වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද මාගේ භාර්යාවට ද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුලුව) අක්කර 50කට (පණහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපොළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර........... රූඩ්............. පර්. ................. ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිළ දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනතේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

————,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

————,
සාමාදාන විනිශ්චයකාරතැන.

02-384

# තනතුරු - ඇබෑර්තු

**ආණ්ඩුකාරවර කාර්යාලය - සබරගමුව පළාත**

**සබරගමුව පළාතේ පළාත් සභාවේ දීපව්‍යාප්ත සේවා පුරප්පාඩු**

පුරප්පාඩු වන සබරගමුව පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවර ලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් නොලැබුනහොත් පළමුවැනි පන්තියේ නිලධාරීන්ගේ අයදුම්පත්‍ර සළකා බලනු ලබන බැවින්, පළමුවැනි පන්තියේ නිලධාරීන්ට ද ඒ සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

*බඳවා ගැනීම.-* මෙම කැඳවීම අනුව ලැබෙන අයදුම්පත්‍ර ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරනු ලැබේ. ආණ්ඩුකාරවර ලේකම් තනතුර සඳහා සුදුසු නිලධාරියකු තෝරා ගැනීම ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ණ අභිමතය පරිදි සිදු කෙරේ.

ආණ්ඩුකාරවර ලේකම් තනතුරේ පුරප්පාඩුව පිරවීම පිළිබඳව අවසාන තීරණය ගරු ආණ්ඩුකාරතුමාගේ තීරණය වනු ඇත.

*අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම.-* ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සඳහා අදාල නිලධාරීන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු වන සේ තමා විසින්ම සකස් කරගත් අයදුම්පත්‍රයක් 2013.03.11 වැනි දිනට පෙර ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් මේ සඳහා අයදුම් කළ හැකිය.

තැපෑලේ දී නැතිවන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් මෙම ආයතනය කිසිදු වගකීමක් දරනු නොලැබේ.

බන්දුල ඒ. නාගසිංහ,
ආණ්ඩුකාරවර ලේකම්,
ආණ්ඩුකාරවර කාර්යාලය,
සබරගමුව පළාතේ පළාත් සභාව.

පළාත් සභා සංකීර්ණය,
නව නගරය,
රත්නපුරය.

02-607

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.